සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 10 - ශ්‍රේණිය

## පුරවැසි අධ්‍යාපනය - I, II

**නම/විභාග අංකය : ........................................................................ කාලය : පැය 03 යි.**

## පුරවැසි අධ්‍යාපනය - I

**සැලකිය යුතුයි :**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

01. ජනතා නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවේ බලය වර්ධනය වීමේ ක්‍රියාවලිය ආරම්භ වන්නේ,

    1. ප්‍රංශ විප්ලවයෙනි.  2. ඉංග්‍රීසි විප්ලවයෙනි.
    3. රුසියන් විප්ලවයෙනි.  4. චීන විප්ලවයෙනි.

02. ඉඩම් භුක්තිය හා බැඳුණු සේවාවන් සැපයීම මත පදනම් වූ කෘෂි ආර්ථික රටාව දැකිය හැකි වූ සමාජ ක්‍රමය වන්නේ,

    1. ලිබරල් වාදයයි.  2. ධනවාදී පාලනයයි.
    3. වැඩවසම් ක්‍රමයයි.  4. පාර්ලිමේන්තු ක්‍රමයයි.

03. ක්‍රි.පූ 6 වන සියවස පමණ වන විට සමූහාණ්ඩු පාලනයක් පැවති ඉන්දීය ජනපදය කුමක් ද?

    1. වජ්ජි  2. මගධ  3. මත්ස්‍ය  4. අංග

04. තීන්දු ගැනීමේ ක්‍රියාවලියට සියලු දෙනාම සම්බන්ධ වූ ඇතැන්ස් නගර රාජ්‍යය අයත් රට වන්නේ,

    1. රෝමයයි.  2. ග්‍රීසියයි.  3. ක්‍රීටයයි.  4. ප්‍රංශයයි.

05. නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන ඇතැම් රටවල් භාවිතා කරන සෘජු ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේදය වන්නේ,

    1. ජනමත විචාරණය  2. සරල බහුතර නියෝජනය
    3. සමානුපාතික නියෝජනය  4. වාර්ගික නියෝජනය

06. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජීවත්වන ජනතාව තුළ දැකිය හැකි ලක්ෂණයක් <u>නොවන්නේ,</u>

    1. අන්‍ය මත ගරු කිරීම.  2. සාකච්ඡා මඟින් තීරණවලට එළඹීම.
    3. සමානාත්මතාව ගරු කිරීම.  4. සමාජ සධාරණත්වය පිටු දැකීම.

07. ශ්‍රී ලංකාවට සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කරනු ලැබුවේ,

1. මැකලම් ආණ්ඩු ක්‍රමයෙනි. 2. සෝල්බරි ආණ්ඩු ක්‍රමයෙනි.
3. කෝල්බෲක් ආණ්ඩු ක්‍රමයෙනි. 4. ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙනි.

08. 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 3 ව්‍යවස්ථාවේ සඳහන් ජනතාව කෙරෙහි පිහිටා ඇති බලය හැඳින්වෙන්නේ,

1. ආධිපත්‍යය යනුවෙනි. 2. ඒකාධිපත්‍යය යනුවෙනි.
3. ස්වාධිපත්‍යය යනුවෙනි. 4. පරමාධිපත්‍යය යනුවෙනි.

09. ඒක පක්ෂ ක්‍රමයක් ඇති රටක් වන්නේ,

1. මහා බ්‍රිතාන්‍යය 2. ඇමෙරිකා එක්සත් ජනපදය
3. කියුබාව 4. ඔස්ට්‍රේලියාව

10. ශ්‍රී ලංකාව බෙදා ඇති මැතිවරණ දිස්ත්‍රික්ක සංඛ්‍යාව,

1. 22 කි. 2. 23 කි. 3. 24 කි. 4. 25 කි.

11. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ,

1. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම.
2. ප්‍රාදේශීය පාලනයට නායකයන් පත්කර ගැනීම.
3. දේශපාලන පක්ෂ ක්‍රමයක් පවත්වා ගෙන යාම.
4. ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කර ගැනීම.

12. ශ්‍රී ලාංකිකයකුට සාර්ව ජන ඡන්ද බලය හිමි වීම සඳහා සපුරාලිය යුතු සුදුසුකමක් වන්නේ,

1. රජයේ රැකියාවක නිරත වීම. 2. වයස අවුරුදු දහඅට සම්පූර්ණ වීම.
3. අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කළ යුතු වීම. 4. දේශපාලන අවබෝධයකින් යුතු වීම.

13. 1848 මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය සම්මත කිරීමෙන් සිදු වූ වැදගත් ම දේ ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

1. පුද්ගල ජීවිතය පරිපූර්ණත්වයට පත් විණි.
2. සමාන අයිතිවාසිකම් සමාජය තුළ ක්‍රියාවට නැංවුණි.
3. මානව අයිතිවාසිකම් වලට නීතිමය ස්වරූපයක් ලැබුණි.
4. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමට සිදු විණි.

14. තරඟකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණයක් වන්නේ,

1. මහජන මතය නියෝජනය නොවීම. 2. අත්තනෝමතික පාලනයක් බිහි වීම.
3. බහුවිධතාව තුළින් එක්සත් බව ගොඩනැගීම. 4. ප්‍රාදේශීය සංවර්ධනයට ඉඩ සැලසීම.

15. A - නීතියේ රැකවරණය සැමට සමාන ව ලැබීම.
B - පාලකයින්ට තම අභිමතය පරිදි කටයුතු කළ හැකි වීම.
C - අධිකරණයේ ස්වාධීනත්වය සුරක්ෂිත වීම.
D - ආර්ථික ප්‍රතිලාභ සැමට සමාන ව ලැබීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන ඇතුළත් පිළිතුර කුමක් ද?

1. A හා B 2. A හා C 3. B හා D 4. B හා C

16. නීතියේ ආධිපත්‍යය යනුවෙන් අදහස් වන්නේ,

1. රටක සියල්ලන්ට ම ඉහළින් නීතිය පැවතීමයි.
2. සැමොම නීතිය අභිබවා කටයුතු කිරීමයි.
3. පවත්නා නීතියට සැමට දඬුවම් පැමිණ වීමයි.
4. නීතියේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමයි.

17. රාජ්‍යය තුළ නීතිය හා සාමය ආරක්ෂා කිරීම ....................................... වගකීම වේ.

1. ආණ්ඩුවේ
2. අධිකරණයේ
3. පොලීසියේ
4. නීතිපතිවරයාගේ

18. ● ව්‍යවස්ථාදායකය තුළින් විධායනය තේරී පත්වේ.
● විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව ඇත.
● ව්‍යවස්ථාදායකය හා විධායකය අතර සෘජු සම්බන්ධතාවක් ඇත.

ඉහත ප්‍රකාශ හා සම්බන්ධවන ආණ්ඩු ක්‍රමය කුමක් ද?

1. රාජාණ්ඩු
2. පාර්ලිමේන්තු
3. ජනාධිපති
4. සමූහාණ්ඩු

19. A හා B ප්‍රකාශ සලකන්න.

A - එක් මාධ්‍යම ආණ්ඩුවක් යටතේ බලය ඒකරාශී වී ඇත්තේ ඒකීය රාජ්‍යයන් තුළය.
B - මහජන සුභසාධනයට අදාළ ප්‍රතිපත්ති සැලසුම් කිරීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක දී සිදු නොවේ.

1. A අසත්‍ය වන අතර B සත්‍ය වේ.
2. A හා B දෙකම අසතය වේ.
3. A හා B දෙකම සත්‍ය වේ.
4. A සත්‍ය වන B අතර අසත්‍ය වේ.

20. සදාචාරාත්මක යුතුකම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

1. වැඩිහිටියන්ට ගරු කිරීම, පවතින නීතියට ගරු කිරීම.
2. රජයට නියමිත බදු ගෙවීම, සමාජ සිරිත් විරිත් පිළිපැදීම.
3. වැඩිහිටියන්ට ගරු කිරීම, සමාජ සිරිත් විරිත් පිළිපැදීම.
4. ආණුඩු ක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂා කිරීම, රජයට නියමිත බදු ගෙවීම.

(ලකුණු 2×20 = 40)